රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :-05/99

මගේ අංකය: IV/2/9/361/8(එච්)1/1
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1999 පෙබරවාරි. 16

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**විනය පරීක්ෂණ නිලධාරී නාම ලේඛණය**

විනය පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් සේවය කිරීමට කැමති හා ඒ සඳහා හැකියාවක් ඇති රජයේ නිලධාරියෙකුට තමන් විශ්‍රාම ලබන අවස්ථාවේ සිටම විනය පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් කටයුතු කිරීමේ අවස්ථාව සලසා දිය යුතු යයි රජය තීරණය කර ඇත.

02. එබැවින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා එවැනි නිලධාරියෙකුට තමන් අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ මත විනය පරීක්ෂණ නිලධාරියකු වශයෙන් ඇතුළත් වීම සඳහා අයදුම් කිරීමට ඉඩ සලසා ඇත.

03. එම ඉල්ලීම් සලකා බැලීම සඳහා මීට අමුණා ඇති ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කර ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ඔබේ නිර්දේශයද සහිතව මා වෙත එවීමට පියවර ගත යුතුය.

04. මෙසේ අලුතින් ඇතුලත් කරනු ලබන විනය පරීක්ෂණ නිලධාරීන්ගේ නාම ලේඛණය තුන්මසකට වරක්ඔබ වෙත එවනු ලැබේ.

(කේ.පී.ආර්. ගුණතිලක)
වැඩ බලන ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

රා.පරි.ලේ.යොමු අංකය:-ආ/IV/2/9/361/
8(එච්) 1/1

**<u>විනය පරීක්ෂණ නිලධාරීන් ඇතුලත් කර ගැනීම.</u>**

01. මුලකුරු සමග නම :-

මුලකුරු වලින් හැදින්වෙන නම් :-

02. පෞද්ගලික ලිපිනය :-

03. පදිංචි දිස්ත්‍රික්කය :-

04. පෞද්ගලික දුරකථන අංකය :-
(තිබේ නම්)

05. උපන් දිනය :-

06. ජාතික හැඳුනුම්පත් අංකය :-

07. රාජ්‍ය සේවයේ අවසන් වරට දැරූ තනතුර :-

08. (අ) අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තුව :-
(ආ අදාළ අමාත්‍යාංශය :-

09. අයත් වු සේවාව සහ ශ්‍රේණිය :-
(ශ්‍රී.ලං.ප.සේ./ශ්‍රී.ලං.ග.සේ/සා.ලි.සේ.අධි ශ්‍රේණිය ආදී වශයෙන් )

10. අවසන් වරට ලත් වාර්ෂික ඒකාබද්ධ වැටුප :-

11. විශ්‍රාම ගිය දිනය :-

12. විනය පරීක්ෂණය පැවැත්විය හැකි මාධ්‍යය :- (සිංහල/ඉංග්‍රීසි/දෙමළ )

13. විනය පරීක්ෂණය පැවැත්විය හැකි දිස්ත්‍රික්කය/දිස්ත්‍රික්ක :-

14. විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ පළපුරුද්ද :-

15. සේවා කාලයේදී යම් විනයානුකුල දඬුවමක් ලබා තිබේද යන වග :-

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි. මා විනය පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් තෝරා ගනු ලැබුවහොත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/96 දක්වා ඇති කොන්දේසි ප්‍රකාර හා රජය විසින් වරින්වර පනවන කොන්දේසි අනුව පැමිණිලි මෙහෙයවීමේ නිලධාරියෙකු වශයෙන් හෝ රැකවරණ නිලධාරියෙකු වශයෙන් ඉදිරියට කටයුතු නොකරන බවට හා විනය පරීක්ෂණ අවසන් වී සති 03 ක් ඇතුළත මගේ වාර්තාව විනය පරීක්ෂණයට අදාල සියළු ලිපිලේඛන සමග අදාළ විනය බලධාරියා වෙත භාර දෙන බවට පොරොන්දු වෙමි.

දිනය: ...................... ..........................................
අයදුම්කරුගේ අත්සන.

## <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරන අතර .................. දින රජයේ සේවයෙන් විශ්‍රාම ලැබීමට නියමිත/විශ්‍රාම ලත් ...........................................මයාගේ/ මියගේ/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කරමි.

දිනය: ............................

...............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

මුද්‍රාව:-

## <u>අදාළ අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශය.</u>

රා.පරි.ස්ව.ක. හා වැ.ක. ලේකම්

ඉහත නිර්දේශයට එකග වෙමි/ එකග නොවෙමි.

..............................................
ලේකම්ගේ අත්සන

අමාත්‍යාංශය :- .....................................
දිනය :- .....................................